සියලු ම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது/ All Rights Reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
DEPARTMENT OF EDUCATION - CENTRAL PROVINCE

අ.පො.ස (උ/පෙළ) පෙරහුරු පරීක්ෂණය - 2026

සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය I	29	S	I	13 ශ්‍රේණිය	පැය දෙකයි

උපදෙස්:

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- එක් එක් ප්‍රශ්නයකට 1,2,3,4,5 යන පිළිතුරු වලින් නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන පිළිතුර තෝරාගෙන , එය උත්තර පත්‍රයේ (X) සලකුණකින් දක්වන්න.
- මෙම පත්‍රයට හිමි උපරිම ලකුණු 50 කි.

1. මානව සන්නිවේදනය බිහිවීම සඳහා බලපෑ වඩාත් ප්‍රබලතම සාධකය ලෙස හඳුනාගත හැක්කේ මිනිසාට අවශ්‍ය වූ,
   (1) තොරතුරු පරීක්ෂා කිරීමට ය. (2) පොළඹවා ගැනීමට ය.
   (3) ඉගෙනීමට හා ඉගැන්වීමට ය. (4) අන්තර් පුද්ගල සම්බන්ධතා ගොඩනගා ගැනීමට ය.
   (5) තොරතුරු සන්නිවේදනය කිරීමටය

2. ජනමාධ්‍යයේ අහිතකර බලපෑමෙන් ජනතාව මුදා ගැනීම සඳහා පෙර පාසල් වියේ සිට මාධ්‍ය අධ්‍යාපනය ලබා දිය යුතු බවට නිර්දේශ කරන ලද්දේ,
   (1) යුරෝපා සංගමය (2) ඉලිනොයිස් විශ්ව විද්‍යාලය
   (3) පෙන්සිල්වේනියානු විශ්ව විද්‍යාලය (4) යුනෙස්කෝ සංවිධානය
   (5) නොබැඳි ජාතීන්ගේ සමුළුව

3. මානව සම්බන්ධතා රඳවා ගැනීමට සන්නිවේදනය ඉවහල් වන බව සිය අර්ථකථනය තුළින් ඉදිරිපත් කළේ,
   (1) ජැනොන් ව්වර් (2) හැරල්ඩ් ලැස්වෙල් (3) විල්බර් ශ්‍රාම්
   (4) ඇරිස්ටෝටල් (5) වාල්ස් කූලි

4. විශාල ක්‍රීඩාංගනයක පැවැති අවුරුදු උත්සවයේ සුවිශේෂී අංග අළලා එක්තරා රූපවාහිනී නාලිකාවක් විසින් ප්‍රවෘත්ති විශේෂාංගයක් ඉදිරිපත් කිරීම අයත් වන්නේ,
   (1) ජන සන්නිවේදනය (2) අථත්‍ය සන්නිවේදනය (3) මහජන සන්නිවේදනය
   (4) කණ්ඩායම් සන්නිවේදනය (5) අන්තර් පුද්ගල සන්නිවේදනය

5. ඇමරිකාව විසින් පසුගියදා දියත් කරන ලද ප්‍රහාරයන් පිළිබඳ ජනමාධ්‍ය මඟින් නිතර නිතර ප්‍රචාරය කිරීම ජනමාධ්‍ය ලක්ෂණ අතර
   (1) මාධ්‍යය ප්‍රතිපෝෂණයකි. (2) මාධ්‍ය බලපෑමකි. (3) මාධ්‍ය විස්තාරණයකි.
   (4) දොරටු පාලන ක්‍රියාවකි. (5) මාධ්‍ය සාක්ෂරතාවයකි.

6. "සංවර්ධනය යනු රටක දූප්පත්කම අසමානතාව හා විරැකියාව අඩු කිරීම හෝ අහෝසි කිරීමයි." මෙම නිර්වචන ඉදිරිපත් කරනු ලැබුවේ,
   (1) සිල්වියෝ වයිස් බෝඩ (2) ශ්‍රී නිවාස මෙල්කෝට් (3) මහත්මා ගාන්ධි
   (4) ඩඩ්ලි සියර්ස් (5) එඩ්ගා ඕවන්ස්

7. සිද්ධි කළමනාකරුවකුගේ කාර්යය නොවන්නේ,
   (1) පාරිභෝගික සේවා සැලසුම් කිරීම. (2) හදිසි අවශ්‍යතා කළමනාකරණය කිරීම.
   (3) ආරක්ෂාව පිළිබඳ අවධානය යොමු කිරීම. (4) මූල්‍ය පිරිවැය සැලසුම් කිරීම.
   (5) සිද්ධි හා අවස්ථා උත්පාදනය කිරීම.

දෙවන පිටුව බලන්න

8. ජනකවි තුළින් බොහෝ දේ සන්නිවේදනය කළ හැකිය. පහත දක්වා ඇති කරුණු අතරින් ඊට අදාළ නොවන්නේ,
(1) ගැමි ජනයාගේ ජීවන දෘෂ්ටිය
(2) විවේකය හා විශ්‍රාන්තිය
(3) අවශ්‍යතා හා වෘත්තිය තොරතුරු
(4) තාක්ෂණික දැනුම
(5) ඇදහිලි හා විශ්වාස

9. සන්නිවේදන ආකෘති හා ඒවායෙහි ලක්ෂණ පිළිබඳ ප්‍රකාශන යුගලයන් කිහිපයක් පහතින් දක්වා ඇත.
A. ලැස්වෙල් ආකෘතිය - දේශපාලන දෘෂ්ටිකෝණයෙන් ඉදිරිපත් කර ඇත.
B. ශ්‍රාම ඔස්ගුඩ් ආකෘතිය - සමාජ විද්‍යාත්මක දෘෂ්ටිකෝණයෙන් ඉදිරිපත් කර ඇත.
C. ෂැනොන් වීවර් ආකෘතිය - ජීව විද්‍යාත්මක දෘෂ්ටිකෝණයෙන් ඉදිරිපත් කර ඇත.
D. ඇරිස්ටෝටල් ආකෘතිය - නූතන සංකීර්ණ සන්නිවේදන ක්‍රියාවලිය විග්‍රහ කිරීමට ප්‍රමාණවත් නොවේ.

ඉහත යුගල අතරින් සදොස් වන්නේ,
(1) A පමණි. (2) C පමණි. (3) C හා D පමණි. (4) D පමණි. (5) AB පමණි

10. සමාජානුයෝජනය සිදුකරන ප්‍රධාන ආකාරයක් වන්නේ,
(1) තදාත්මීකරණය
(2) වගකීම
(3) වගවීම
(4) පරිකල්පනය
(5) ආචාරශීලී බව

11. සංස්කෘතිය යනු,
A. මානව අත්දැකීම් හා හුරුපුරුදු හා හැකියා ඇතුළත් සමස්තයයි.
B. ජනමාධ්‍ය මඟින් උගන්වනු ලබන ඇඟයීම් පද්ධතියයි.
C. සමාජය එකට බැඳ තබන වගකීම් වලින් සමන්විත වූවකි.
D. මානව සබඳතා මත බිහිව වර්ධනය වූවකි.

ඉහත කරුණුවලින් වඩාත් නිවැරදි වන්නේ,
(1) AB පමණි.
(2) CD පමණි.
(3) ABC පමණි.
(4) AC හා D පමණි.
(5) ඉහත සියල්ලම වේ.

12. සයුරු සිහිනයකින් දුටු රූපාවලියක් සිත් හි මවාගෙන කෙටිකථාවක් ලියන්නට සූදානම් විය. එහි සිදුවූ සන්නිවේදන වර්ගය වන්නේ,
(1) දෘෂ්‍ය සන්නිවේදනය යි.
(2) ලිඛිත සන්නිවේදනය යි.
(3) ජන සන්නිවේදනය යි.
(4) අන්තර්වර්ති පුද්ගල සන්නිවේදනය යි.
(5) අකථ්‍ය සන්නිවේදනය යි.

13. මාර්ෂල් මැක්ලුහන් දක්වා ඇති පරිදි අංග ඡේදනය යන්නෙහි සරලම අදහස වන්නේ,
(1) මාධ්‍ය සංස්කෘතියෙහි මිනිසා අණ්ඩාක්‍රමණය වීමයි.
(2) මාධ්‍ය සංස්කෘතියට ඇබ්බැහි වීමයි.
(3) මාධ්‍ය සංස්කෘතියෙහි සමකාලීන අවශ්‍යතාවයකි.
(4) මාධ්‍ය සංස්කෘතියේ ශක්‍යතාවයකි.
(4) මාධ්‍ය සංස්කෘතිය සතු පරාරෝපණයකි.

14. ලියනාඩෝ ඩාවින්චි විසින් ඉදිරිපත් කරන ලද නිර්මාණශීලීත්වයේ මූලිකාංග පමණක් දැක්වෙන වරණය කුමක්ද?
(1) කුතුහලය, සතතාභ්‍යාසය සහ සම්බන්ධතා
(2) සධු ගමනය, සංජානනය, සංවේදනය
(3) සම්බන්ධතා, සධුගමනය, සංවේදනය
(4) සුවිදර්ශය, සංජානනය, කුතුහලය
(5) සංවේදනය, සතතාභ්‍යාසය, ප්‍රස්තුත ගවේෂනය

15. ජනමාධ්‍යයෙන් ඉදිරිපත් කරන ප්‍රවෘත්තියකට අදාළ තොරතුරු විවරණය කරමින් ඊට අදාළ හේතු ඵල සම්බන්ධතා දැක්වීමට අදාළ ජනමාධ්‍ය කාර්යභාරය කුමක්ද?
(1) සුපරීක්ෂණය
(2) සහ සම්බන්ධය
(3) අර්ථ කථනය
(4) විසරණය
(5) සමාජානුයෝජනය

16. මහාචාර්ය පිලිප් කොට්ලර් ඉදිරිපත් කරන සිද්ධි වර්ගීකරණයක් නොවන්නේ,
(1) සමාජ හා ජීවන චක්‍ර සිද්ධි (2) දේශපාලන සිද්ධි (4) ජාත්‍යන්තර සිද්ධි
(4) ආගමික සිද්ධි (5) අධ්‍යාපනික හා වෘත්තිය සිද්ධි

17. රාජ්‍ය හා ඊට සම්බන්ධ ආයතන මඟින් සිදු කරන ක්‍රියාවලීන්ට අදාළ තොරතුරු දැන ගැනීමට පුරවැසියාට යම් අවස්ථාවක් ලබා දීමට ප්‍රතිපාදන සලසන්නේ,
(1) බුද්ධිමය දේපළ පනත වේ. (2) තොරතුරු දැනගැනීමේ පනත වේ.
(3) ජනමාධ්‍ය වේ. (4) සමාජ මධ්‍ය වේ.
(5) සුපරීක්ෂණ කාර්ය වේ.

18. • අධිරාජ්‍යවාදී ආකෘතියක් ක්‍රියාත්මක වීම.
• වාර්ගික ජාතික සීමාවන් අභිබවා ක්‍රියාත්මක වීම.
• සම්ප්‍රදායයන් අභියෝගයට ලක්වී ඒකීය සමාජයක් ගොඩනැගීම.

ඉහත ලක්ෂණ අඩංගු සංස්කෘතික ප්‍රභේදය විය හැක්කේ,
(1) මාධ්‍ය සංස්කෘතිය යි. (2) සාම්ප්‍රදායික සංස්කෘතිය යි. (3) ගෝලීය සංස්කෘතිය යි.
(4) ජනප්‍රිය සංස්කෘතිය යි. (5) සම්භාව්‍ය සංස්කෘතිය යි.

19. මහජන සම්බන්ධතා අවශ්‍ය වන අවස්ථාවක් නොවන්නේ,
(1) මහජන ජීවිත ඵලදායී ලෙස ඒකාබද්ධ කිරීමට.
(2) සාමූහික ක්‍රියාදාම කෙරෙහි ජනතා සහභාගිත්වය අවම කිරීමට.
(3) නව භාණ්ඩ හා සේවාවන් හඳුන්වා දීමට.
(4) තරඟකාරීත්වයක් ඇතිවන අවස්ථාවක ප්‍රතිවිරෝධය ජයගැනීමට.
(5) සංවිධානයක් හා පාර්ශව කරුවන් අතර ඇතිවන මතභේද සමනය කිරීමට.

20. ස්ව කේන්ද්‍රය/ස්ව පථය යන්නට නොගැළපෙන ප්‍රකාශය තෝරන්න.
(1) ස්වකේන්ද්‍රය යනු සරලව ගත්විට යම් පුද්ගලයකු සතු ශක්තිය හා සැලසුමයි.
(2) ස්වකේන්ද්‍රය දුර්වල අවස්ථාවක මාධ්‍ය බලපෑමට ඇති ඉඩ කඩ අඩුය.
(3) පුද්ගල ස්වකේන්ද්‍රය දෙයාකාරයකින් ක්‍රියාත්මක වෙයි.
(4) ස්වකේන්ද්‍රය අවිඥානිකව ක්‍රියාත්මක වන විට මාධ්‍යයේ බලපෑම් වැඩිය.
(5) එය සවිඥානිකව පුද්ගලයාට නිවැරදි තීන්දු තීරණ ගැනීමට පොළඹවයි.

21. සංස්ලේෂණය යනු,
(1) සංදේශයක අඩංගු හරය නිරවුල්ව පැහැදිලිව කෙටියෙන් ඉදිරිපත් කිරීමයි.
(2) පොදු කරුණු උපයෝගී කොටගෙන විශේෂ දෙයක් පැහැදිලි කිරීමට උත්සාහ කිරීමයි.
(3) තිබෙන කොටස් එකතු කොට අලුත් ව්‍යුහයක් ගොඩ නැංවීමයි.
(4) පිළිගත හැකි විනිශ්චයකි.
(5) අපේක්ෂිත ප්‍රතිඵල ඉදිරිපත් කිරීමෙන් කිසියම් සාර්ථකත්වයක් ලබාගැනීමයි.

22. සන්නිවේදනයේ ස්වභාවය සම්බන්ධයෙන් සාවද්‍ය ප්‍රකාශය වනුයේ,
(1) සන්නිවේදනය සංවේගාත්මකය. (2) සන්නිවේදනය සන්දර්භානුගතය.
(3) සන්නිවේදනය ඒක මාර්ගික මෙන්ම ද්විමාර්ගික වූවකි. (4) සන්නිවේදනය බලය වේ.
(5) සන්නිවේදනය සන්නිවේදන කේන්ද්‍රීය හා ග්‍රාහක කේන්ද්‍රීය වේ.

23. අතථ්‍ය සන්නිවේදනය පිළිබඳ නිරවද්‍ය ප්‍රකාශය සහිත වරණය වන්නේ,
(1) යම් මතයක් ජනගත කිරීමට හෝ ගොඩනැඟීමට අදාළ ය.
(2) ඉලක්ක ග්‍රාහක පිරිසෙන් ඔබ්බට තොරතුරු ලබාදිය නොහැක.
(3) ග්‍රාහක කේන්ද්‍රීය බව සුවිශේෂී ලක්ෂණයකි.
(4) පුද්ගලයින් රැසක් සම්බන්ධව වුවද භෞතික වශයෙන් ඉඩකඩ අවශ්‍ය නොවේ.
(5) මානව වර්යා හා ඉරියව් මෙමඟින් හඳුනාගත හැකිය.

24. විධිමත් සන්නිවේදනයේ ලක්ෂණයක් නොවන්නේ,
(1) සන්නිවේදකයා ඉතා පැහැදිලි වීම.
(2) නිල වශයෙන් වගකීමක් ඇත.
(3) නිශ්චිත ධුරාවලියක් සහිතය.
(4) නිත්‍යානුකූල බවක් ඇත.
(5) ඉතා පැහැදිලි මූලාශ්‍රයක් සෑම විටම නොමැතිය.

25. ප්‍රකට කලාකරුවකුගේ අවමංගල්‍ය අවස්ථාවක ඉතා ශෝකාකූල හඬ පෞරුෂයකින් නිවේදන කටයුතු සිදුකළ නිවේදකයාම ජාතික නිදහස් උත්සවයේ දී දැඩි ගාම්භීර හඬකින් යුතුව නිවේදන කටයුතු සිදු කළේය. මෙයින් අදහස් වන්නේ සන්නිවේදනය,
(1) ක්‍රියා පටිපාටියක් බව ය.
(2) සන්දර්භානුගත බව ය.
(3) අරමුණු සහගත බව ය.
(4) ද්වි මාර්ගික බව ය.
(5) බලයක් බව ය.

26. මහජන සබඳතා යන්න සංකල්පයක් ලෙස ප්‍රභවය වීමට ආසන්න හේතුව වූයේ,
(1) සේවක වැඩ වර්ජනයේ බලපෑම යි.
(2) ව්‍යක්තිය වටිනාකමක් හිමිවීම යි.
(3) සන්නිවේදන විෂය සංවර්ධනය යි.
(4) දෙවන ලෝක යුද්ධයේ බලපෑම යි.
(5) ආයතනික හා සංවිධානවල ප්‍රබල බව යි.

27. ශ්‍රී ලංකාව තුළ ජාතික සයිබර් ආරක්ෂක ආයතනය වශයෙන් ක්‍රියාත්මක වෙමින් විවිධ සංවිධාන හා පුද්ගලයන් විසින් සිදු කරනු ලබන සයිබර් අපරාධ සඳහා කඩිනම් ප්‍රතිචාර දැක්වීම සිදු කරන්නේ,
(1) ශ්‍රී ලංකා සයිබර් අපරාධ වැළකීමේ සංවිධානය
(2) ශ්‍රී ලංකා පරිසණක හදිසි ප්‍රතිචාර සංසදය
(3) ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ආයතනය
(4) ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය
(5) විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව

28. එක්තරා සිනමා පටයක් ආරම්භ කිරීමේ දී ප්‍රථමයෙන් ම කථාවේ සිදුවීම් පෙළේ ආරම්භය සිදුවන ස්ථානයේ ඇති දුර රූපයක් ඉදිරිපත් කරන ලදී. එම රූපය හඳුන්වන්නේ,
(1) සංකේතාර්ථ රූපය ලෙස
(2) සංස්ථාපන රූපය ලෙස
(3) චිත්තරූප ලෙස
(4) ආරම්භක රූපය ලෙස
(5) සංකල්ප රූපය ලෙස

29. යුනෙස්කෝ සංවිධානය විසින් මැක්බ්‍රයිඩ් කොමිසම ආරම්භ කරන ලද්දේ,
(1) ගෝලීය මාධ්‍ය නිරූපණය සාධාරණීකරණය කිරීමට
(2) මාධ්‍ය සම්බන්ධ මහජන පැමිණිලි විමර්ශනය කිරීමට
(3) මාධ්‍ය ආචාර ධර්ම හා මාර්ගෝපදේශ සකස් කිරීමට
(4) යටත් විජිත ගුවන්විදුලි මාධ්‍ය හැසිරීම පිළිබඳ ප්‍රතිපත්ති හඳුන්වාදීමට
(5) සන්නිවේදන ප්‍රතිපත්ති සකස් කිරීමට

30. ජපානයේ සිදු වූ භූ කම්පන සිද්ධිය සිදුවී සුළු මොහොතකට පසු සමාජ මාධ්‍ය ඔස්සේ ශ්‍රී ලාංකිකයන්ට දැන ගත හැකි වීමට හේතු වූ නව මාධ්‍ය ලක්ෂණය නම්,
(1) ජාලගතකරණය යි.
(2) ස්වයං ක්‍රියාකාරීත්වය යි.
(3) අධිවේග සංදේශකරණය යි.
(4) අන්තර් ක්‍රියාකාරීත්වය යි.
(5) අධි පාඨනීයත්වය යි.

31. සංස්කෘතික ප්‍රභේද කිහිපයක් හා එහි ලක්ෂණ පහත දක්වා ඇත.

A. (i) සම්ප්‍රදායික සංස්කෘතිය
(ii) ජනතාවගේ බිම් මට්ටමේ ලැදියා හා අවශ්‍යතා නියෝජනය කරයි.

B. (i) මාධ්‍ය සංස්කෘතිය
(ii) ජාතික සංස්කෘතික ප්‍රභේදවලට සමීපව කටයුතු කරයි.

C. (i) ජන සංස්කෘතිය
(ii) දෛනික ශ්‍රම ක්‍රියාකාරිත්වය පිළිබඳ තොරතුරු අනාවරණය කරයි.

D. (i) ජනප්‍රිය සංස්කෘතිය
(ii) සියලු දෙනාට සමීප වීම හා නොගැඹුරු සරල මහා පරිමාණික නිෂ්පාදනයන් සිදුකරයි.

ඉහත කරුණු අතරේ ගැලපෙන සංස්කෘතික ප්‍රභේද හා ලක්ෂණය වන්නේ,

(1) A හා B පමණි. (2) C හා D පමණි. (3) B හා D පමණි.
(4) B හා C පමණි. (5) A හා D පමණි.

32. ජන සන්නිවේදන ක්‍රියාවලිය එක් තැනකින් ආරම්භ වී ප්‍රතිපෝෂණය ලෙස ආපසු හැරී එන අයුරු පෙන්වා දීමට ආකෘතියක් සම්පාදනය කළේ,

(1) ෂැනොන් හා වීවර් ය. (2) හයිබර්ට්, ඔන්ගුරේට් හා බොන් ය.
(3) ඩිෆ්ලුවර් හා ඩෙනිස් ය. (4) හැරල්ඩ් ඩී ලැස්වෙල් ය.
(5) ශ්‍රාම් හා ඔස්ගුඩ් ය.

33. යුරෝපා කොමිසමේ අර්ථ කථනයට අනුව මාධ්‍ය සක්ෂරතාවයේ මූලික නිපුණතාවන්ට අයත් නොවන්නේ,

(1) පරිහරණය කිරීමේ කුසලතාවය (2) විශ්ලේෂණ කිරීමේ කුසලතාවය
(3) ඇගයීමේ කුසලතාවය (4) නිර්මාණය කිරීමේ කුසලතාවය
(5) විග්‍රහ කිරීමේ කුසලතාවය

34. සම්මුඛ ක්‍රියාවලියකදී ප්‍රශ්නාවලිය සැකසීම සම්බන්ධව සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.

(1) පක්ෂපාති පිළිතුරු අපේක්ෂාවෙන් ප්‍රශ්න නොඇසීම.
(2) දක්ෂ දායකයන් අපහසුතාවයට පත්වන අයුරින් ප්‍රශ්න නොඇසීම.
(3) අනුමාන ප්‍රශ්න නොඇසීම.
(4) විස්තරාත්මක පිළිතුරු ලබා දිය හැකි ප්‍රශ්න ඇසීම.
(5) එකම ප්‍රශ්නය නැවත නැවත නොඇසීම.

35. ජනමාධ්‍ය ග්‍රාහකත්වය සම්බන්ධයෙන් දැකිය හැකි ලක්ෂණය වන්නේ,

(1) සංදේශයෙන් පමණක් බැඳී සිටීමයි. (2) මනා ලෙස සංවිධානය වී සිටීමයි.
(3) එකම අරමුණක් වෙනුවෙන් එක් වීමයි. (4) පැහැදිලිව ගණනය කළ හැකි වීමයි.
(5) සන්නිවේදකයා සමඟ සමීප සබඳතාවයක් පැවතීමයි.

36. පළතුරු ආශ්‍රිත නිෂ්පාදන වෙළඳපොලට ඉදිරිපත් කරන තරුණයෙක් වාර්තා චිත්‍රපටියක් නිර්මාණය කිරීම සඳහා නිර්මාණ ශිල්පියෙක් සමග එක්ව රූප රාමු සැලසුම් කළ ආකාරය පහත දැක්වේ.

A. මුළු කර්මාන්තශාලාවම දිස්වන පරිදි ඉදිරි පෙනුම රූගත කළ යුතුය.
B. නිෂ්පාදන අංශයේ යෙදී සිටි සේවිකාවකගේ රූපය අවට පසුබිම සමඟ පෙන්විය යුතුය.
C. ආයතන හිමිකරුගේ ඉදිරිපත් කිරීමේදී මුහුණේ ඉරියව් පැහැදිලි විය යුතුය.
D. අවසන් දර්ශනයේ වෙළඳ නාමය ඉතා පැහැදිලිව දැක්විය යුතුය.

ඉහත රූගත කිරීම් වලට අදාළ වඩාත්ම ගැළපෙන රූප රාමු අනුපිළිවෙළ වන්නේ,

(1) අති දුර රූපය, දුර රූපය, සමීප රූපය, අති සමීප රූපය
(2) දුර රූපය, සමීප රූපය, මධ්‍ය රූපය, අති දුර රූපය
(3) දුර රූපය, මධ්‍යම රූපය, අති දුර රූපය, සමීප රූපය
(4) ඉත දුර රූපය, දුර රූපය, අති දුර රූපය, සමීප රූපය
(5) අති දුර රූපය, මධ්‍ය රූපය, දුර රූපය, සමීප රූපය

37. ජනමාධ්‍යයේ සුවිශේෂී කාර්යයන් අතර මුර සෙබළ, සාකච්ඡා මණ්ඩපයක භූමිකාව, ගුරුවරයාගේ භූමිකාවේ ආදිය හඳුන්වා ඇත්තේ,
(1) ෂැනොන් වීවර් (2) විල්බර් ශ්‍රාම් (3) ඩිෆ්ලුවර් හා ඩෙනිස්
(4) වෝල්ස් කුලී (5) හැරල්ඩ් ලැස්වෙල්

38. පරිශීලකයාට ම සංස්කරණය කළ හැකි මාධ්‍ය,
(1) ග්‍රන්ථ ය. (2) පෝස්ටර ය. (3) සමාජ මාධ්‍ය ය. (4) පුවත්පත ය. (5) රූපවාහිනිය

39. විචාරශීලී ග්‍රාහකයා විසින් විධිමත් මිනුම් දඩු ආශ්‍රිතව ප්‍රවෘත්තියක යෝග්‍යතාව මැන බැලීම යනු
(1) සංස්ලේෂණය යි. (2) කාණ්ඩ කරණය යි. (3) විශ්ලේෂණය යි.
(4) වියුක්තිකරණය යි. (5) තක්සේරුකරණය යි.

40. දත්ත පිළිබඳ ප්‍රකාශ කිරීමේදී සංඛ්‍යා හෝ වචන වෙනුවට භාවිතා කළ හැකි රූපික ප්‍රකාශන,
(1) ආකෘතියකි. (2) නියැදියකි. (3) ප්‍රස්ථාරයකි. (4) සිතියමකි. (5) වගුවකි.

41. ප්‍රධාන සංවක වශයෙන් අන්තර්ජාලය යොදා ගනිමින් සිදු කරනු ලබන සන්නිවේදන වර්ගය වන්නේ,
(1) ජන සන්නිවේදනය (2) මහජන සන්නිවේදනය
(3) අන්තර් පුද්ගල සන්නිවේදනය (4) අතථ්‍ය සන්නිවේදනය
(5) සමූහ සන්නිවේදනය

42. ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන ස්වයං නියාමන ආයතනයක් වන්නේ,
(1) ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම (2) ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය
(3) ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (4) ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය
(5) ප්‍රසිද්ධ රැගුම් පාලක මණ්ඩලය

43. "කුමන හෝ දහ දැනුම් ක්ෂේත්‍රයක් ඉතා සැලකිල්ලෙන් සොයා බැලීම හෝ විමසීම මගින් නව කරුණු එකතු කර ගැනීම පර්යේෂණයයි." මෙම නිර්වචන ඉදිරිපත් කොට ඇත්තේ,
(1) මාක් ඒබ්‍රහම් (2) හර්මන් එන් මෝර්ස් (3) මල්ලසේකර ශබ්ද කෝෂය
(4) ඔක්ස්පර්ඩ් උසස් ශිෂ්‍ය ශබ්ද කෝෂය (5) ජේම්ස් ඩබ්. පෝටර්

44. උසස් පෙළ සිසුන්ගේ අධ්‍යයන සාධකය කෙරෙහි ජංගම දුරකථන භාවිතයේ ඇති බලපෑම කෙබඳු දැයි යන්න සොයා බැලීම සඳහා ඔබ සමීක්ෂණයක් කිරීමට අදහස් කරන්නේ නම් එහි පළමු කාර්ය විය යුත්තේ,
(1) අරමුණු හඳුනා ගැනීම යි. (2) ගැටළුව හඳුනා ගැනීම යි. (3) දත්ත රැස් කිරීම යි.
(4) මාතෘකාව හඳුනාගැනීම යි. (5) නිගමනය හා යෝජනා ඉදිරිපත් කිරීම යි.

45. තොරතුරු සංරක්ෂණයේ පදනම සකස් වන්නේ,
(1) භාෂණයේ සම්භවය සමඟිනි.
(2) ලේඛනයේ ආරම්භයත් සමඟිනි
(3) ජනමාධ්‍ය සමාජගත වීමත් සමඟිනි.
(4) මුද්‍රණ තාක්ෂණයේ දියුණුවත් සමඟිනි
(5) ඩිජිටල් දත්ත සංචිත කරණයේ ආරම්භයත් සමඟිනි.

46. තුන්වන ලෝකයේ රටවල් වල සංවර්ධන ක්‍රියාවලිය සාර්ථක කර ගැනීමට සුදුසුම ක්‍රමය වන්නේ ඒ ඒ රටවල්වල තම රටට උචිත ලෙසින් සංවර්ධන ක්‍රියාවලියේ නිරත වීමයි. සංවර්ධනයේ දී මෙම ක්‍රියාවලි හඳුන්වන්නේ,
(1) නාගරීකරණය (2) ග්‍රාමීයකරණය (3) කාර්මීකරණය (4) ප්‍රාදේශීයකරණය (5) ගෝලීයකරණය

47. මුද්‍රිත මාධ්‍ය තුළ පාරභාෂිත භාෂාව භාවිතා කළ හැකි ස්වරූපයක් වන්නේ,
(1) ශාස්ත්‍රීය කෘතිවල (2) පුවත්පත්වල (3) පෞද්ගලික ලිපිවල
(4) නව කථාවල (5) දැන්වීම් වල

48. ගෝලීය සංවර්ධනයේ දී මුහුණ දෙන අභියෝගයක් නොවන්නේ,
(1) ජනගහන වර්ධනය (2) පොසිල ඉන්ධන භාවිතය (3) සාගර දූෂණය
(4) දේශගුණික විපර්යාස (5) මිරිදිය වැඩිවීම

49. එක්සත් ජාතීන්ගේ අධ්‍යාපන විද්‍යාව හා සංස්කෘතික සංවිධානය හඳුන්වන්නේ,
(1) යුනිසෙෆ් ලෙසිනි. (2) යුරෝපා සංගමය ලෙසිනි. (3) යුනෙස්කෝ ලෙසිනි.
(4) ලෝක සෞඛ්‍ය සංවිධානය ලෙසිනි. (5) සාර්ක් සංවිධානය ලෙසිනි.

50. ප්‍රවත්පත් ශීර්ෂ පාඨයක දී සැලකිලිමත් විය යුතු කරුණක් නොවන්නේ,
(1) සරල භාෂාවක් භාවිතා කළ යුතුය. (2) අක්ෂර වින්‍යාසය පිළිබඳ සැලකිලිමත් විය යුතුය.
(3) පද කෙටි කිරීම සෑම අවස්ථාවකදීම සිදුකළ යුතුය. (4) ස්ථිර නොමැති දේ නොලියා සිටිය යුතුය.
(5) උප හා ප්‍රාදේශීය භාෂා අවම කළ යුතුය.

**

සියලු ම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது/ All Rights Reserved

மத்திய மாகாண கல்வித் திணைக்களம்
மධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
DEPARTMENT OF EDUCATION - CENTRAL PROVINCE

අ.පො.ස (උ/පෙළ) පෙරහුරු පරීක්ෂණය - 2026

සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය II	29	S	II	13 ශ්‍රේණිය	පැය තුනයි

අමතර කියවීම් කාලය - මිනිත්තු 10

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

උපදෙස්

- ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
- එක් ප්‍රශ්නයකට හිමි උපරිම ලකුණු 40 කි.

1. මානව සන්නිවේදනයේ ආරම්භය මානව සම්භවය දක්වා දිවෙන ක්‍රියාවලියකි.
   (i) මානව සන්නිවේදනයේ දී නාලිකා ලෙස භාවිතා කරන්නේ මොනවා ද?
   (ii) අන්තර් පුද්ගල සන්නිවේදනයේ ප්‍රයෝජන දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න.
   (iii) විල්බර් ශ්‍රාම් විසින් දක්වන ලද ජනමාධ්‍ය මගින් ඉටු කළ යුතු ප්‍රධාන භූමිකා තුන පිළිබඳ විස්තර කරන්න.
   (iv) මහජන සම්බන්ධතා මෙවලම් දෙකක් හා විධි ක්‍රම දෙකක් නිදසුන් සහිතව පැහැදිලි කරන්න.

2. සන්නිවේදනය විවිධාකාර වේ.
   (i) නව මාධ්‍යවල දක්නට ලැබෙන ලක්ෂණ දෙකක් නම් කරන්න.
   (ii) විචාරශීලී ග්‍රාහකයෙකු සතු කුසලතා දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න.
   (iii) ව්‍යාපාර මහජන සම්බන්ධතාවයේ දී ග්‍රාහකයා ආකර්ෂණය කර ගැනීම සඳහා යොදාගත හැකි උපක්‍රම තුනක් විස්තර කරන්න.
   (iv) ශ්‍රී ලංකාවේ මාධ්‍ය ක්ෂේත්‍රයට අදාළ ආයතනික ප්‍රවණතා හතරක් නම් කොට ඉන් දෙකක් උදාහරණ ඇසුරින් විස්තර කරන්න.

3. විවිධ සන්නිවේදන ස්ථරයන්හි දියුණු වීමත් සමහම අවධිමත් සන්නිවේදනයට ද ඊට සාපේක්ෂව ව්‍යාප්ත විය.
   (i) "ඔපා දූප" අවධිමත් සන්නිවේදනයට අයත්වන අතර එහි ඇති සුවිශේෂීභාවයට අදාළ ලක්ෂණ දෙකක් ලියන්න.
   (ii) නිර්වාචික සන්නිවේදනයේ අංග දෙකක් නිදසුන් ඇසුරින් පැහැදිලි කරන්න.
   (iii) ජනශ්‍රැතියේ අංග හයක් නම් කොට ඉන් තුනක් පිළිබඳ විස්තර කරන්න.
   (iv) වත්මන් ජන මාධ්‍ය විසින් ග්‍රාහකයා ආකර්ෂණය කර ගැනීම සඳහා භාවිතා කරන උපක්‍රම හතරක් පිළිබඳ විස්තර කරන්න.

4. පාසල් වර්ණ ප්‍රදානෝත්සවයේ සංවිධාන කටයුතු මාධ්‍ය ඒකකයට භාරදී ඇතැයි සිතන්න.
   (i) මෙම අවස්ථාව සඳහා සිද්ධි කළමනාකරණයේ අවශ්‍යතාවයට අදාළ හේතු හතරක් සඳහන් කරන්න.
   (ii) මෙහි මාධ්‍ය නිලධාරියාගේ කාර්යභාරය ඔබ වෙත පැවරී ඇත්නම් එහි පූර්ව සංවිධාන කටයුතු වලට අදාළ කාර්යයන් දෙකක් පිළිබඳ විස්තර කරන්න.
   (iii) මෙම සිද්ධිය කළමනාකරණය කිරීමේදී අනුගමනය කළ යුතු අවස්ථා හා පියවරයන් පිළිබඳ විස්තරයක් කරන්න.
   (iv) විවිධ අවස්ථා සැමරීමට ජනයා පුරුදු වී ඇත. එවැනි අවස්ථා හතරක් පිළිබඳ පැහැදිලි කරන්න.

PAST PAPERS WIKI

5. (i) මාධ්‍ය නියාමනය යනු කුමක්දැයි පැහැදිලි කරන්න.

(ii) මානව නිර්මාණශීලිත්ව හැකියාව මගින් බිහි කරන, සමස්තයට අයිතිවාසිකම් සලසන නීත්‍යානුකූල ලියැවිල්ල කුමක්ද? ඒ පිළිබඳ හැඳින්වීමක් කරන්න.

(iii) මාධ්‍ය නියාමන ප්‍රවේශ තුනක් පිළිබඳ විස්තර කරන්න.

(iv)"සමාජ වගකීම වෙනුවෙන් නියාමනයේ අවශ්‍යතාව" යන මාතෘකාව යටතේ පහත නියාමන ආයතනයන්හි කාර්යභාරය හා වගකීම් උදාහරණ සහිතව විස්තර කරමින් පුවත්පතකට වවන දෙසිය පනහකට නොඅඩු ලිපියක් ලියන්න.

(අ) ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව

(ආ) ශ්‍රී ලංකා පරිසනක හදිසි ප්‍රතිචාර සංසදය

6. වත්මන් සංවර්ධන සංකල්පයේ ස්වභාවය සංවර්ධනය සඳහා සන්නිවේදනය යන්න මත රැඳී පවතී.

(i) එක්සත් ජාතීන්ගේ සංවිධානය ප්‍රකාශයට පත්කර ඇති අන්තර් සම්බන්ධිත සංවර්ධනයට අදාළ ප්‍රවේශ හතර නම් කරන්න.

(ii) සංවර්ධනය පිළිබඳ නිර්වචනයක් දක්වා ඉන් එකක් විස්තර කරන්න.

(iii)සංවර්ධන සන්නිවේදනයට අයත් පහත සඳහන් මාතෘකා දෙක පිළිබඳ කෙටි සටහන් ලියන්න.

(අ) මාධ්‍ය ගුණාත්මක භාවය

(ආ) අත්‍යවශ්‍ය මානුෂීය තොරතුරු සම්පාදනය

(iv)සමාජ මාධ්‍යවල ඇති ධනාත්මක ලක්ෂණ හතරක් සහ සෘණාත්මක ලක්ෂණ හතරක් පිළිබඳ විස්තර කරන්න.

7. (i) ගුවන් විදුලි මාධ්‍යයේ ලක්ෂණ දෙකක් නම් කරන්න.

(ii) කථන සන්නිවේදන කුසලතා වර්ධනයට ඉවහල් වන කරුණු දෙකක් විස්තර කරන්න.

(iii)වර්තමානයේ සාක්ෂරතා සංකල්පය විවිධ ක්ෂේත්‍ර ඔස්සේ පුළුල් වී ඇත. පහත දැක්වෙන ක්ෂේත්‍ර දෙක පිළිබඳ නිදසුන් සහිතව පැහැදිලි කරන්න.

(අ) දෘශ්‍ය සාක්ෂරතාවය

(ආ) පරිසණක සාක්ෂරතාවය

(iv) ගෝලීය සංස්කෘතිය වර්තමාන සමාජ වෙනස්වීම්වලට බලපා ඇති ආකාරය ප්‍රධාන කරුණු 04ක් ඇසුරින් පහදන්න.

***

අ.පො.ස.(උ.පෙළ) පෙරහුරු/වර්ෂ අවසාන පරීක්ෂණය/க.பொ.த(உயர் தர)முன்னோடிப்பரீட்சை/ஆண்டிறுதிப்பரீட்சை /

G.C.E (A/L) Practice /Year End Test 202.....

බහුවරණ උත්තර පත්‍රය/பல்தேர்வு விடைத்தாள்/MCQ Answer Sheet

විෂයය සහ විෂය අංකය
பாடமும் பாட எண்ணும்
Subject and Subject No.

සම්ප්‍රදාය හා ආධුනික 29

මාධ්‍යය
மொழிமூலம்
Medium

සිංහල

විභාග අංකය
சுட்டெண்
Index No.

විභාග අංකය හා අධීක්ෂණ භාරයේ නිලධාරිනි විසින් නිවැරදි විභාග අංකය සහ විෂය සඳහා ලියාපදිංචි කර ඇති බව සහතික කරමි.
சுட்டெண்ணும் ஏனைய விபரங்களும் சரியானவை என்பதற்காக நோக்குனரின் கையொப்பமும் திகதியும்
Invigilator's signature and date for correct Index Number and other details

1	①	②	③	⑧	⑤	11	①	②	③	⑧	⑤	21	①	②	⑧	④	⑤	31	①	⑧	③	④	⑤	41	①	②	③	⑧	⑤
2	①	②	③	⑧	⑤	12	①	②	③	⑧	⑤	22	①	②	③	④	⑧	32	①	⑧	③	④	⑤	42	①	②	③	⑧	⑤
3	①	②	③	④	⑧	13	⑧	②	③	④	⑤	23	①	②	③	⑧	⑤	33	①	②	③	④	⑧	43	①	②	③	⑧	⑤
4	⑧	②	③	④	⑤	14	①	②	⑧	④	⑤	24	①	②	③	④	⑧	34	①	②	③	⑧	⑤	44	①	⑧	③	④	⑤
5	①	②	⑧	④	⑤	15	①	②	⑧	④	⑤	25	①	⑧	③	④	⑤	35	⑧	②	③	④	⑤	45	①	②	③	⑧	⑤
6	①	②	③	⑧	⑤	16	①	②	⑧	④	⑤	26	⑧	②	③	④	⑤	36	⑧	②	③	④	⑤	46	①	②	③	⑧	⑤
7	①	②	③	⑧	⑤	17	①	⑧	③	④	⑤	27	①	⑧	③	④	⑤	37	①	⑧	③	④	⑤	47	⑧	②	③	④	⑤
8	①	②	③	⑧	⑤	18	①	②	⑧	④	⑤	28	①	⑧	③	④	⑤	38	①	②	⑧	④	⑤	48	①	⑧	③	④	⑤
9	①	⑧	③	④	⑤	19	①	⑧	③	④	⑤	29	⑧	②	③	④	⑤	39	①	②	③	④	⑧	49	①	②	⑧	④	⑤
10	⑧	②	③	④	⑤	20	①	⑧	③	④	⑤	30	①	②	⑧	④	⑤	40	①	②	⑧	④	⑤	50	①	②	⑧	④	⑤

වැරදි ප්‍රතිචාර සංඛ්‍යාව
பிழையான துலங்கலின் எண்ணிக்கை
No.of incorrect responses

උත්තර පත්‍ර පරීක්ෂක සංකේත අංකය හා අත්සන/
விடைத்தாள் பரீட்சகரின் குறியீட்டெண்ணும் ஒப்பமும்/
Code No. and Signature of Marking Examiner

දායකයිගේ ලකුණු නොවිමසා නිවැරදි පරීක්ෂණය සඳහා
மாணவர் பரீட்சகருக்காக

1.
2.
3.

නිවැරදි ප්‍රතිචාර සංඛ්‍යාව
சரியான துலங்கலின் எண்ணிக்கை
No.of correct responses

පෙරහුරු පරීක්ෂණය - 2026
13 ශ්‍රේණිය - ජීවිතූරු පත්‍රය.

(I) i) පංචේන්ද්‍රියයන්

(ලෙ. 05)

ii) * මෙහෙත් පහසුවෙන් අන්තර ක්‍රියාකාරී සන්නිවේදනයක යෙදීමට ඇති හැකියාව
* අන්තර් සම්බන්ධතා වර්ධනය කර ගැනීමට හැකි වීම
* වඩා හොඳ සිහවේදනයකට අවකාශ සැලසීම.
* අනෙකුත් සන්නිවේදන වර්ගයන්ට සාපේක්ෂ ව පෙළඹවීමට ඇති හැකියාව
* බාධක අවම කර ගත හැකි වීම.
* සන්නිවේදක ශ්‍රාවක භූමිකා හුවමාරු කරගත හැකි වීම.
* පුනිවාර පුත්‍යෝජන ඇතිවීම ව සිදු වීම.

දෙකක් යොදයේ විස්තර කළ යුතුය.

2×4 (ලෙ. 08)

iii) 1. ආරක්ෂිකයෙකුගේ භූමිකාව
2. ඝාතකවිරා මෘගධරයන ගේ භූමිකාව
3. ගුරුවරයෙකුගේ භූමිකාව

විස්තර කළ යුතුය.

3×4 (ලෙ. 12)

iv)

මෙවලම්	විධික්‍රම
ත්‍රිවංශික නිවේදන	නැග ලබා දීම
මාධ්‍ය කවිටලු	සම්මාන පිරිනැමීම
ලොක් පිරුළු	දිරි දීමනා
චිත්තර පත්‍රිකා	උපදේශනය
පුවත් පත්‍ර	අරමුදල් ලබා දීම
චාර්ත්ත භාර්තා	මහජන මතය විමසීම
ජායාරූප	විශේෂ සිද්ධි කළමනාකරණය

මෙවලම් දෙකක් හා විධික්‍රම දෙකක් පිළිබඳ විස්තර කළ යුතුය.

4×4 (ලෙ. 16)

(2) i) * අංකනකාරණය
* ජාලගත කරණය
* අන්තර් ක්‍රියාකාරිත්වය
* අධ්‍යාපනීයත්වය
* ව්‍යවහාරකරණය
* දින්න සංවිධානකාරණය
* වේගවත් සංවේදීකාරණය.

නම් කිරීමට (ලෙ. 4)

ii) * විශ්ලේෂණය
* අගැයීම
* කාර්ය කරණය
* අනුමානය
* නිගමනය
* සංස්ලේෂණය
* ව්‍යුත්පත්ති කරණය.

දෙකක් විස්තර කිරීමට
2 x 4 (ලෙ. 8)

iii)
වෙළඳ වර්ධනය ලබා දීම
ව්‍යාපෘති ප්‍රවර්ධන කටයුතු සිදු කිරීම
ආයතනික සමාජ වගකීම් ක්‍රියාවට නැංවීම
මාධ්‍ය ප්‍රචාරණ සිදු කිරීම
වෙළඳ ප්‍රදර්ශන පැවැත්වීම
මාධ්‍ය සම්මන්ත්‍රණ පැවැත්වීම
අනුග්‍රහකත්වය ලබාදීම.

තුනක් විස්තර කළ යුතුය.
3 x 4 (ලෙ. 12)

iv) ආයතනික ප්‍රවර්ධන

නිර්මාණශීලීත්වය
ප්‍රාදේශීය මාධ්‍ය
මාධ්‍යකරුවෝ
ස්ත්‍රී පුරුෂ සමාජ භාවය
මාධ්‍ය නීතිරීති
සංස්කාරක මණ්ඩල

හතරක් නම් කොට දෙකක් විස්තර කළ යුතුයි.

නම් කිරීමට 1 x 4 - 4
විස්තර කිරීමට 6 x 2 - 12
(ලෙ. 16)

③ i) මුලාශ්‍රය හැඟෙන්නේ ඒ හඳුනාගත නොහැකි.
නිල ස්වභාවයක් නොමැත.
වේගයෙන් විනාශ වේ.
සීමිත, දීන, මේලාවූ අභිප්‍රේත නොවේ.
ඕනෑ හැකියි ආකල්ප විරෝධතා ප්‍රකාශ කළ හැකිය.

ලක්ෂණ දෙකක් ලිවීම
2×2 (ල. 4)

ii) සිරුරු බහි - මුහුණේ ප්‍රකාශන, ඉරියව්, ඉඟි, මුද්‍රා, නර්තන විලාස, සංගීත භාණ්ඩ අවිනය

- රූප, සැලසුම්, ලාංඡන, සංඛේත, පින්තූර, රූප සිටහන්, රජස්වර, ආයුධරූප, චිත්‍ර, හස්ත මුද්‍රා, ශබ්ද, සංඥා භාෂා, සිතියම් -

කොටයෙන් විස්තර කළයුතුය
4×2 - (ල. 8)

iii) ජන කතා
ජන කවි
ජන ක්‍රීඩා
ජන ඇඳුම්පිලි
ජන විශ්වාස
ජන භූවාදී
ඉතිහාස්ත්‍රී
ජන රංග
යාතු කර්ම

අංග හයක් නම් කොට ඒවා පිළිබඳ විස්තර කළයුතුය.

iv)
* සම්මන යථාකාර වැඩ සටහන්
* ආහාර ලබා දීම
* ඔසුවල් ලබා දීම
* නරඹා සැවැත්වීම
* විදේශ සංචාර ලබා දීම
* ආකර්ෂණීය ප්‍රවර්ධන වැඩ සටහන් පවත්වීම -

ඉදිරිය නව වැඩ සටහන් ආකෘති සඳහන් කර ඇත් නම් ලකුණු ගිරිකාමිය යුතුය.
4×4 - (ල. 16)

④ i) සංඝයේ ප්‍රතිරූපය වර්ධනය කිරීමට
කාලය කළමනාකරණයට
මුදල් කළමනාකරණයට
අර්බුධකාරී තත්ව කළමනාකරණයට
මාධ්‍ය මගින් ප්‍රචාරණ කිරීමට
භාරගත් කටයුතු දිනා ගැනීම හා අදාළ ගැනීමට.

(ලකු 04)

ii) * සංඝයා හා වර්ග පුද්ගලෝත්පාදනය ජිවිතයේ මාධ්‍ය මගින් ප්‍රචාරණ කිරීම
* මාධ්‍ය සාකච්ඡා, අදාළ මාධ්‍ය ප්‍රකාශන ආදිය සාදාගැනීම කිරීම
* සංඝයා දැක්ම හා මෙම ඉන්නවයේ සම්බන්ධතාව ජිවිතයේ ප්‍රචාරණ කිරීම
* ඉන්නවය ජිවිතයේ මාධ්‍ය ආයතන අවශ්‍ය සාදාගැනීම කිරීම
* සම්මාන මාධ්‍ය සඤ්ඤය තත්වයෙන් පවත්වාගෙන යාම
* වෙබ් අඩවිය සාදාගැනීම කිරීම
* දූරකථන, විද්‍යුත් තැපෑල් මගින් සම්බන්ධතා පැවැත්වීම.

අදාළ කාර්යයන් දෙකක් ජිවිතයේ විස්තර කිරීම.

2 x 4 (ලකු 8)

iii) 1. සාදාගැනීම
2. ජිවිතයෙදී කිරීම.
3. විමසීම
4. ක්‍රියාව

විස්තර කළ යුතුය 4 x 3 (ලකු 12)

iv)
* පවුල්වල් අවශ්‍යතා
* සංඝ්‍රාහක්‍ය අවශ්‍යතා
* ගුණ සාධන අරමුදල් පිහිටුවා කිරීමේ අවශ්‍යතා
* ක්‍රීඩා අවශ්‍යතා
* විශ්‍රාන්තිය අවශ්‍යතා
* සංචාරය ආකර්ෂණය අවශ්‍යතා
* ආස්ථිය වෙළඳ ප්‍රදර්ශන

අවශ්‍යතා 4 ක් විස්තර කිරීමට 4 x 4 -(ලකු 16)

(5) i) මහජන ආයතනයක් විසින් ප්‍රජාවගේ හිඳි ගැනීමට ලක් වූ ක්‍රියාකාරකමක් හිඳිබඳව බලපවත්වූ ලබා ගුලක්ක ගත හැකියන් නියාමනය කරන හැඳින්වීය හැකිය.

සමාන හිඳිකුරුකට (ල.4)

ii) 2003 අංක 36 දරන පනත.

විස්තර කළ යුතුය (ල.8)

iii)
1. සිවියම නියාමනය
2. සිහනියාමනය
3. වෘවස්ථාපිත නියාමනය
4. අභ්‍යන්තරීන නියාමනය

විස්තර කිරීමට අදාළව 3×4 - (ල.12)

iv) i) ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව

ii) ශ්‍රී ලංකා පරිභෝජන හඳිසි ප්‍රතිකාර සංසදය -

13 ගුරුතාර්කෝරදේශ සංගුහය - 87 හා 88 ජිවුවලට අදාළව විස්තර කර ඇත් නම් ලකුණු ප්‍රදානය.

8×2 - (ල.16)

(6) i) 1. හැසිරීම් වෙනස්කම් සඳහා සන්ත්වේදනය
2. සමාජීය වෙනස්කම් සඳහා සන්ත්වේදනය
3. නියාමනය සඳහා සන්ත්වේදනය
4. චාරිත්‍රික සමතුලිතතාවය සිඳීමෙන සන්ත්ක්ෂිදනය.

(ල.04)

ii) සාමාන්‍ය නිර්දේශිත නිර්මාණයකට අදාළ කර ඇති විස්තරයේ ස්වභාවයට අදාළ ව ලකුණු ප්‍රදානය. (ල.08)

iii) * මාධ්‍ය ගුණාත්මක භාවය.
නූතන ස්වාධීන මාධ්‍යවලට සහාය දීම මගින් ප්‍රජාතන්ත්‍රවාදී කතිකාවෙහි මාධ්‍යවල ගුණාත්මකභාවය ආරක්ෂා කිරීම. අධ්‍යාපනය ලබාදීම, ආඥා, සහාය, දූතයාය හිටුදැකීම සුදුසු සංවිධාන තෝරීම, දේශීය ප්‍රජා ක්‍රියාකාරිත්වය යනාදිය මාධ්‍ය ඔස්සේ සිදු විය යුතු බව විස්තර කළ යුතුය.

* අනාවරණ මානුෂීය නෛතිකය, සම්ප්‍රදානය.
මිනිස්කම හා බැඳුණු මානුෂීය ගුණාංග වර්ධනය වීමට සහායවන මූලික අවශ්‍යතා සපුරා ගැනීමට අදාළ නෛතිකය කිරීම අදාළය. ආහාර, වාසය, ජීවය, ලිංගිකත්වය, ආරක්ෂාව, අනන්‍යතාව, සංස්කෘතිය, ඉරණම යනාදියට අදාළ ප්‍රමාණවත් නෛතිකය සඳහන් කළ යුතුය.

ප්‍රමාණවත් පරිදි විස්තර කළ යුතුය. 6×2 - (ල.12)

iv) ධනාත්මක ලක්ෂණ -

* සමාජය ගුණාත්මයෙන් වර්ධනය වීම
* පවතින සම්පත් ඵලදායී කාර්යක්ෂම භාවිතයක් ඇති වීම
* පුද්ගල නිර්මාණශීලිත්වය වෙනස් ලෙස ගණ හැකි වීම
* කාර්යක්ෂම ව හා අඩු ව්‍යවසායක් තොරතුරු ලබාගත හැකි වීම
* පහසුවෙන් සංඥාවල විරෝධාභාසය ප්‍රවලිත කළ හැක වීම.
* අධ්‍යාපන කටයුතුවලට ප්‍රයෝජනවත් වීම.
* විඥානාත්මක හා වෙළඳ සන්නාම ප්‍රචාරයට
* සංවර්ධන ප්‍රතිඵල දියුණු වීමට හැකි වීම.
* සමාජ සම්බන්ධතා වර්ධනය කර ගැනීමට හැක වීම.

සෘණාත්මක ලක්ෂණ

* මානසික හා සමාජ කම්පනය ඇති කිරීම
* පෞද්ගලිකත්වය හිඳිකඩ ගැටළු ඇති වීම
* වාසය තොරතුරු සංක්‍රමණය වීම
* පුද්ගල අහංකාර බහුල වීම
* සයිබර් හිරිහැර / අපරාධ සිදු වීම
* ප්‍රවණ්ඩ ක්‍රියාවලට පෙළඹවීම
* අසභ්‍ය වැඩි සවහන් වලට ගැඹුරු වීම
* වාසාදු ගිණුම් අවතක්සා ගෙන යාම.

කරුණු 4 බැගින් නම් කර විස්තර කිරීමට
8 x 2 (ලකු 16)

(7) i) ශ්‍රවණ මාධ්‍යයක් වීම
එක් දිගානතව සංදේශ ගමන් කිරීම
කාර්යක්ෂම හා සමීප මාධ්‍යයක් වීම
පහසුවෙන් පරිහරණය කළ හැක වීම
සාක්ෂරතාව අවශ්‍ය වීම
අඩු ව්‍යදම් සහිත ජංගම රේඩියෝ මාධ්‍යයක් වීම
පරිසරදූහිත මාධ්‍යයක් වීම
එක් වරකදී ස්වේච්ඡාව නැති පරිදි සංදේශ වියුක්තවත් කළ යුතු වීම.
සාක්ෂරතාව අවශ්‍ය වීම
විහිදා සැරසෙන්නිය සීමාවක් ඇතිවීම

කරුණු කිරීමට (ලකු 4)

ii) කැපී පෙනෙන සන්නිවේදන කුසලතා වර්ධනයට ඉවහල් වන කරුණු

* සවන් දීම
* දෘශ්‍ය කෝණයන්ගේ කතා අනුකරණය
* හඬවැදි ලිවීම/අනුකරණය
* සම්මුතියක් ඇතිවීම
* කියවීම, අනුභූතිය
* නව පුද්ගලයෙකුට ඇතිවීම
* වාග් රක්ෂය පුළුල් කර ගැනීම
* රසාස්වාදය හැකියාව වර්ධනය වීම
* [illegible]

සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

කුඩුකිරීමට 2 x 4 = 8.

(7) iii) (අ) දූරගාමී සංක්‍රමණයයි -

රැකවල අප්‍රේල් නිරූපණයයි. රැළිවලය නිර්මාණාත්මක සංයුතිය අවබෝධ කර ගැනීම ලෙස හැඳින්විය හැකිය. ඇතිතලේ කොළ අක්කක් ඔළුවේ සිට වර්තමානයේ නිරයක් මත දූරගාමී රූප නාරඹිව දැනවා ගමන් මගෙහි පුරුෂෝත්ම නැත් ඇදුම්වල විස්තර ඒය යුතුය.

(ආ) පරිසරය සංක්‍රමණයයි.

අවස්ථාවෝචිතව ම ගැළපෙන රටෙහි මෙතුනංග නෙත්වා ගන්නේ සාමාන්‍ය කරිවට අවශ්‍ය සංසර්ගනාවී වගේ ඇඟිලි රේඛාවල රේඛාවන්ගේ විසංගතයක් සමග රෙදිය කටයුතු සඳහන් ඇඹියනා සංක්‍රමණය අවශ්‍ය යි. වර්තමානයේ දී මෙහි නව රෙයා ගැහැණු රේඛාවෙන් AI තාක්ෂණය දක්වා දියුණු වී ඇත.

පැහැදිලි කිරීම 4×2 = 8
නිදසුන් 2×2 = 4
(ලකුණු 12 යි)

iv) රංගවේදීය සංක්‍රාන්තිය වර්තමාන සමාජ වෙනස් තුළ ඉලක්ක ඇති ආකාරය

* පාරිභෝගික සංක්‍රාන්තියක් ඇති කිරීම
* නව තාක්ෂණික රාශියට ලක් වීම
* සංක්‍රාන්තික කම්පනයක් ඇති කිරීම
* මානව සම්බන්ධතා ශක්තිමත් වීම
* විශේෂාංග අය පුළුල් වීම
* ජාත්‍යන්තර සම්බන්ධතාවය යටත් වීම හා විශ්වාසනීය වීම
* රංගවේදීය ප්‍රතිඵල සංක්‍රාන්තිය විසඳා වීම
* මාර්ග හා අධ්‍යාපන කුටුම්බවලට යොමු වීම
* කවිතිර සංක්‍රාන්තික සාධක විශ්වාසනීය වීම
* මාධ්‍ය ආයතන ප්‍රතිපත්තිමත් ව වැඩ වීම

කරුණු 4 ක් විස්තර කිරීම
4×4 (ලකුණු 16)

PAST PAPERS WIKI
WWW.PastPapers.WiKi
Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Paper Bank